Lanka Microfinance Practitioners' Association

# ලංකා කුෂුද්‍ර මූල්‍ය නියුක්තිකයන්ගේ සංගමයේ සාමාජිකයින් සඳහා

# ආචාරධර්ම මාලාව

**හැඳින්වීම**

අඩු ආදායම්ලාභී ගෘහ ඒකකයන් සඳහා මූල්‍ය සේවාවන් ලබාදීම තුලින් මූල්‍ය අන්තර්ගතය ප්‍රවර්ධනය කිරීම සහ සමාජයීය ප්‍රතිලාභ නිර්මාණය කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් බලාපොරොත්තු වේ. මෙම ආයතන තම ගනුදෙනුකරුවන් සමග මූල්‍ය සබඳතා ගොඩනැගීමේදී ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් ගනුදෙනුකරුවන්ට ඵලදායි හා ගෞරවාන්විත සේවාවක් ලෙස ලබාදීමට හැකිවන සේ තම අරමුණු හා ක්‍රියාපටිපාටින් අර්ථ දැක්වීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකා රජය විසින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා හඳුන්වා දී ඇති නියාමන උපදේශයන්ට අමතරව LMFPA ආයතනය හඳුන්වාදෙනු ලබන මෙම ආචාරධර්ම මාලාව ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයේ සහ එහි සේවක මණ්ඩල ඉහළ වෘත්තීය මට්ටමක් ලගා කර ගන්නා බවටත් සදාචාරය හා යහපාලනය පවත්වාගෙන යන බවටත් තහවුරු කරන්නක් වේ. තවද මෙම ආචාරධර්ම මාලාවට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා ඒවායේ සේවක මණ්ඩලය අවනත වීම LMFPA සාමාජිකත්වය පවත්වාගෙන යාමට ඉවහල් වන ප්‍රධාන කොන්දේසියකි.

1. **අධික ණයගැති භාවය වලක්වා ගැනීම**

1.1 ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය ගෘහ ඒකකය ලබා ගෙන ඇති ණය සංඛ්‍යාව හා ප්‍රමාණය මෙන්ම මෙතෙක් ගෙවීමට ඇති ණය මුදල් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත යුතුය.

1.2 ණය වාරික ගෙවීමෙන් පසු ගෘහ ඒකකයේ අතැති ඉතිරිය අවම වශයෙන් ඔවුන්ගේ ආදායමෙන් 40%ක් වත් වන්නේ දැයි ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය විසින් තහවුරු කරනු ඇත.

1.3 ගෘහ ඒකකය වත්මන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයේ හා වෙනත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තුලින් ගත් ගෙවීමට ඇති ණය ගණන 3කට වඩා වැඩි වූ විට, ලබා ගන්නා ණය මුදල රු. 200,000/= ඉක්මවන විට දී ගනුදෙනුකරු CRIB සාමාජිකයෙකුගෙන් පෙර ණය මුදලක් ලබා ඇති විට ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයට ගනුදෙනුකරුගේ CRIB වාර්තාවක් ලබා ගැනීමට පියවර ගත හැකිය.

1.4 ගෘහ ඒකකයට විශාල ණය මුදලක් (රු.200,000/= සහ වැඩි) ලබා දීමේදී ඔහු හෝ ඇය විසින් ලබා ගෙන ඇති පෙර ණය 2/3ක් හෝ පිළිගත හැකි කොන්දේසි සහිතව ණය සම්පූර්ණයෙන් ගෙවා දමා ඇති බවට, නැවත ණයක් ලබා දීමට පෙර ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය විසින් තහවුරු කරගත යුතුය.

1.5 සිය ප්‍රධාන මූල්‍ය සේවාවේ කාලය අවම වශයෙන් මාස 6 ක් හෝ ඊට වැඩි වන ලෙස නිර්මාණය කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වග බලාගත යුතුය.

1.6 ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය, ගනුදෙනුකරුවන් නියැදියක් ගෙන අභ්‍යන්තර විගණනයක් කිරීම තුලින් ඔවුන් ණය වර්ග කිහිපයක් ගෙන ඇත්දැයි තහවුරු කරගත හැකිය.

2. <u>විනිවිදභාවය පවත්වාගෙන යාම</u>

2.1 ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තම ගනුදෙනුකරුවන් හා ණය ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම එම ගනුදෙනුකරුට ලබාදෙන්නා වූ මූල්‍ය සේවාව හා සම්බන්ද සියළුම වියදම් ඇතුලත්ව සපල පොළී අනුපාතය ගනුදෙනුකරුට සන්නිවේදනය කල යුතුය. මෙම තොරතුරු මූල්‍ය සේවාව හා සම්බන්ධ සියලු ප්‍රවර්ධන ද්‍රව්‍ය වල සඳහන් කළ යුතුය.

3. <u>ණය ලබාදීමේ හා අයකරගැනීමේ ක්‍රියාවලිය</u>

3.1 ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා ඔවුනගේ නියෝජිතයන් ගනුදෙනුකරුවනට ඔවුන්ගේ සේවා ලබාදීමේදී ජාතිය, ආගම, ආබාධිත බව හෝ දරිද්‍රතා මට්ටම හෝ සැලකිල්ලට ගනිමින් වෙනස්කම් සිදු නොකල යුතු අතර සාධාරණව හා ගෞරවාන්විතව සේවය සැලසිය යුතුය.

3.2 ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, ඔවුන්ගේ සේවදායකයන් හා නියෝජිතවරුන් තම ගනුදෙනුකරුවන්හට ණය ලබා දීමේදී හෝ අයකරගැනීමේදී හෝ සිදුවිය හැකි දූෂණ හෝ වංචා මෙන්ම කළහකාරී ලෙස හැසිරීම් හෝ පරිභවකිරීම් අනාවරණය කරගැනීමට සහ වලක්වා ගැනීමට ආරක්ෂණ ක්‍රමවේදයක් සැකසිය යුතුය. මෙවැනි හැසිරීම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග හා ඊට අදාල වාරණ සේවාදායකයන්ගේ පත්වීම්ලිපියේ ඇතුලත් කලයුතු වේ.

3.3 නිවෙස් කරා යෑම හා දුරකථන සංවාද ගනුදෙනුකරු අපහසුතාවයට පත් නොවන අයුරින් සිදුකිරීමට වග බලා ගත යුතුය.

3.4 ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය විසින් තම ණය දෙන නිලධාරීන්හට සහ ණය අයකරගැනීමේ නිලධාරීන්හට රාජකාරී හැඳුනුම්පතක් ලබා දිය යුතු වේ.

4. <u>හිතකර වූ තරගකාරීත්වයක් පවත්වාගෙන යාම</u>

4.1 යම් ප්‍රදේශයක මූල්‍ය ආයතනයක් ව්‍යාප්ත කිරීමට සැරසීමේදී එම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන හෝ වර්තමානයේ පවතින ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම.

4.2 අනෙකුත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල සේවකයන් තම ආයතනයට බඳවා ගැනීමේදී සාධාරණ හා සදාචාරාත්මක ක්‍රියාවලියක් අනුගමනය කිරීම.

**4.3** එවැනි බඳවා ගැනීමකදී පෙර රැකියාවේ යෙදී සිටි ආයතනයෙන් නිදහස් කල බවට ලිපියක් බඳවා ගන්නා අවස්ථාවේදී අයදුම්කරුගෙන් ලබා ගැනීම.

**4.4** වංචනික ක්‍රියා මත හෝ විනය හේතු මත සේවයෙන් පහකරන ලද සේවකයන් පිළිබඳ තොරතුරු LMFPA ආයතනය වෙත දැනුම් දිය යුතුය.

**4.5** ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් කාර්ය මණ්ඩල බඳවාගැනීමේදී LMFPA ආයතනයෙන් ඔවුන් පිළිබඳ නිෂ්කාශණයක් සිදුකර ගත හැක.

## 5. ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් සැකසීම

**5.1** ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සහ ගැටළු විසඳුමට කාර්යක්ෂම හා ක්‍රියාකාරී ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් සකසනු ඇත.

**5.2** ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තම ගනුදෙනුකරුවන්ට මෙම යාන්ත්‍රණයේ පැවැත්ම, අභිප්‍රාය මෙන්ම එයට ප්‍රවේශ වන ආකාරය ද පැහැදිලි කල යුතුය.

## 6. තොරතුරු බෙදා ගැනීම

**6.1** LMFPA ආයතනයේ දත්ත ප්‍රකාශනයන් සඳහා හෝ ඔවුනට තොරතුරු දැනගැනීමට අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් තම සංඛ්‍යා ලේඛන තොරතුරු ඔවුනට ලබා දිය යුතුය.

## 7. කාර්ය මණ්ඩල ගුණාත්මකභාවය

**7.1** ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තම කාර්ය මණ්ඩලයේ, ක්ෂුද්‍ර මූල්‍ය මූලධර්ම හා සම්බන්ධ අනෙකුත් විෂයන් පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම පිළිබඳ නැවත නැවත අවධානය යොමු කල යුතුය.

**7.2** ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය තම කාර්ය මණ්ඩලයේ සියල්ලන් මෙම ආචාරධර්ම මාලාව පිළිබඳ දැනුවත් කිරීමට වග බලා ගත යුතුය.

**8. <u>ආචාරධර්ම මාලාව උල්ලංඝනය කිරීම</u>**

**8.1** කිසියම් සාමාජිකයකු විසින් ආචාරධර්ම මාලාව උල්ලංඝනය කිරීමක් පිළිබඳ LMFPA ආයතනය වෙත ලිඛිතව දැනුම්දිය හැකිය.

**8.2** එවිට LMFPA ආයතනය මෙම පැමිණිල්ල නිරීක්ෂණය කොට විභාග කිරීම පිණිස ස්වාධීන ආයතනයක්/පුද්ගලයකු වෙත ඉදිරිපත් කරනු ඇත.

**8.3** යම්කිසි ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් විසින් ආචාරධර්ම මාලාව උල්ලංඝනය කරනු ලබන අවස්ථාවකදී පළමුව ඔවුන් වෙත අවවාදාත්මක ලිපියක් යවනු ඇත.

**8.4** ඉන්පසු මෙම ආචාරධර්ම මාලාව නැවත නැවත උල්ලංඝනය කිරීමේදී එම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයේ සාමාජිකත්වය LMFPA ආයතනය විසින් අත්හිටවනු ලැබේ.

**8.5** එලෙස සාමාජිකත්වය අත්හිටවූ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මුද්‍රිත මාධ්‍යයන් ඔස්සේ ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**9.** මෙම ආචාරධර්ම මාලාව කලින් කලට සංශෝධනය කරනු ලබන අතර එයට අවනත වීම LMFPA සාමාජිකත්වය පවත්වාගෙන යාමට අනිවාර්ය සාධකයකි.

**<u>ප්‍රතිඥාව</u>**

ලංකා ක්ෂුද්‍ර මූල්‍ය නියුක්තිකයන්ගේ සංගමයේ සාමාජික ………………………………………………………………….. නම් අප ආයතනය ඉහත දක්වා ඇති ආචාර ධර්ම මාලාව අනුගමනය කරන බවට මෙයින් ප්‍රතිඥා දෙමු.

……………………..		……………………

අත්සන		නිල මුද්‍රාව

නම

තනතුර

දිනය